**මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 23  - 2022**

**-----------------------------------------------------------------------**

## 1. විගණන මතය

1.1 මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 23 ක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 23 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 23 හි තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇති අතර, තත්ත්වාගණනය කළ මතය සඳහා හේතුවී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 අනුව උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුව ද, ගොවිජන සේවා කාරක සභා 09 ක එකතුව රු.2,271,832 ක අක්කර බදු ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි ගිණුම් වාර්තා සකස් කිරීමේදී අක්කර බදු ආදායම් උපචිත පදනම මත ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 30(4) ඡේදය අනුව යන්ත්‍රෝපකරණ පිරිවැය මත ක්ෂය කළ යුතු වුවද බණ්ඩරපොල, කිඹිස්ස හා ලග්ගලපල්ලේගම යන ගොවිජන සේවා කාරක සභාවල යන්ත්‍රෝපකරණ හීනවන ශේෂ ක්‍රමය මත ක්ෂය කර තිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් පුහුණු කරන ලද ගිණුම් ප්‍රතිපත්ති අනුව සියලු වත්කම් හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2000 ජූනි 06 දිනැති අංක 518/2000 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 03 ඡේදය අනුව 2022 වර්ෂයේ ගොවිජන බැංකු 23 හි මූල්‍ය ප්‍රකාශන ගොවිජන සේවා කාරක සභාවල මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුව ගිණුම් වාර්තාව සකස් කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 16 දිනැති අංක 7/5/8/312 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ ලිපියේ උපදෙස් අනුව කටයුතු නොකර ගොවිජන සේවා කාරක සභා 07 ක් විසින් සහනාධාර පොහොර කිලෝ ග්‍රෑම් 16761 ක් වැඩිමිලට අලෙවි කර ලැබී තිබුණු රු.1,960,054 ක් කාරක සභාවේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | දිස්ත්‍රික් කාර්යාලය මගින් ලබා දුන් උපදෙස් අනුව ගිණුම් වාර්තා සකස් කළ බව හා ඉදිරියේදී උපදෙස් ලැබෙන ආකාරය අනුව ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 04 ක 2020/21 මහ කන්නයේ පොහොර වියදම් ප්‍රතිපූරණය එකතුව රු.391,636 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස සලකා ගිණුම් ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පසුගිය වර්ෂයට අදාළව ප්‍රතිපූර්ණය වූ මුදල් සමුච්චිත අරමුදලට හෝ ලැබිය යුතු ගිණුම්වලට ගැලපිය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගොවිජන සේවා කාරක සභා 08ක ස්ථාවර තැන්පත් පොලී රු.372,153 ක්, ලැබිය යුතු ගොවිජන බැංකු ලාභාංශ රු.484,046 ක්, අද ගොවි ප්‍රවේණි මුදලින් කාරක සභාව රඳවා ගත යුතු රු.16,685 ක් හා ගෙවිය යුතු අද ගොවි ප්‍රවේණි රු.182,115 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | වර්ෂයට අදාළ ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට ගොවිජන සේවා කාරක සභා 04 ක විගණන ගාස්තු රු.77,420 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 ගිණුම් වාර්තා පිළියෙල කිරීමේදී නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ඇල්කඩුව ගොවිජන සේවා කාරක සභාව මගින් සහනාධාර පොහොර අත්තිකාරම් පියවීම සඳහා 2020 හා 2021 වර්ෂවලදී නිකුත් කරන ලද රු.125,000 ක චෙක්පත් 02 ක් අහරුවී ඇතත් එය නැවත ණයහිමි ගිණුමට ගැලපීම් නොකර දෝශ සහගතව සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. | මෙම චෙක්පත් වටිනාකම් ගෙවිය යුතු ශේෂයන් වන අතර 2023 වර්ෂයේදී ගිණුම් වාර්තා පිළියෙල කිරීමේදී නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | තැන්න ගොවිජන සේවා කාරක සභාවට ලැබිය යුතු රු.999,371 ක ගොවි බැංකු ලාභාංශයක් දෝෂ සහගත ලෙස කාරක සභාවෙන් ගෙවිය යුතු ලාභාංශයක් සේ ගිණුම්ගත කර තිබුණි. | ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා ඇති රු.999,371 ක් 2023 වර්ෂය තුළ නිවැරදි කරන බව. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | 2019 වර්ෂයේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලග්ගල පල්ලේගම ගොවිජන සේවා කාරක සභාවට ලැබුණු ස්ථාවර වත්කම් 13 කට අදාළව 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ රු.123,757 ක් හා සමාලෝචිත වර්ෂයට අදාළ රු.52,760 ක් ක්ෂය ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී එය නිවැරදි කරන බව. | වත්කම්වලට අදාළ නිවැරදි ක්ෂය වටිනාකම් හඳුනාගෙන සම්චිත අරමුදලට හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගැලපිය යුතුය. |
| (ඌ) | 2022 දෙසැම්බර් 31 දින වන විට භෞතිකව විනාශ වී ඇති රු.581,851 ක තොග හෙට්ටිපොල ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි අවසන් තොගය යටතේ දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී ඉවත් කිරීමට කටයුතු කරන බව. | විනාශ වී ඇති තොග විධිමත්ව ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | 2020 ඔක්තෝබර් 01 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලයක් සඳහා මධ්‍යස්ථාන අලෙවි සැලෙන් හඳුන්ගමුව ගොවිජන සේවා කාරක සභාවට අයවිය යුතු රු.317,493 ක් හා අලෙවිසැලට ගෙවිය යුතු රු. 389,084 ක් නිරවුල්ව ගිණුම්ගත කර නොතිබුණි. | අලෙවිසැල විසින් කාරක සභාව වෙත ගෙවිය යුතු කුලී ආදායම මාස 16 ක් සඳහා රු.80,000 ක් වුව ද, කාරක සභාවට අය වි යුතු මුළු මුදල රු.317,493 කි. නමුත් කාරක සාභාව විසින් අලෙවිසැලට ගෙවිය යුතු මුදල ලෙස රු.393,084 ක් පවතී.<br>ඒ අනුව අයවිය යුතු මුදල අඩු කළ විට තව දුරටත් රු.75,590 ක් අලෙවි සැලට ගෙවිය යුතු මුදලක් ලෙස පවතින බව. | ලැබිය යුතු හා ගෙවිය යුතු දෑ නිවැරදිව හඳුනාගෙන වෙන් වෙන්ව ගිණුම් තැබිය යුතුය. |

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 12 ක ආදායම් විෂයයන් 05 ක, වත්කම් විෂයයන් 07 ක, වගකීම් විෂයයක හා හිමිකම් විෂයයකට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන්, අනුරූපී වාර්තා සමඟ සැසඳීමේදී එකතුව රු.1,991,026 ක නොසැසඳීම් පැවතුණි. | නිවැරදි කිරිමට අවශ්‍ය කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ආ) | වාසලකෝට්ටේ ගොවිජන සේවා කාරක සභාවේ දෛනික ලැබීම් ලේඛනය අනුව ශේෂය මුදල් පොතේ ශේෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ආරම්භක මුදල් ශේෂයේ රු.17,654 ක නොසැසඳීමක්ද අවසාන මුදල් ශේෂයේ රු.20,300 ක නොසැසඳීමක්ද පැවතුණි. | නිවැරදි අයුරින් ගැලපීමට අදාළ කටයුතු සිදු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.3.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාලවෙල ගොවිජන සේවා කාරක සභාවේ 2020 හා 2021 වර්ෂවල සිට පැවත එන එකතුව වූ රු.76,235 ක බැර ශේෂ හා රු.33,760 ක හර ශේෂයක් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට ගැලපීම් කර කපාහැර තිබුණි. එසේම, හඳුන්ගමුව ගොවිජන සේවා කාරක සභාවේ ඉකුත් වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.103,100 ක ණයගැති ශේෂයක් අනුමැතියකින් තොරව අරමුදලට ගලපා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණි. | නැවත අවශ්‍යතාවයන් අනුව ආපසු ලබා ගැනීමට හැකි වන පරිදි ශේෂයන් සමුච්චිත අරමුදලට ගැලපීමට කටයුතු කරන අතර, රු.103,100 ක ගෙවිය යුතු ශේෂයක් පෙන්නුම් කළ ද සත්‍ය ලෙස එවැනි මුදලක් ගෙවිමට නිරීක්ෂණය නොවූ බැවින් අරමුදලට ගැළපීමට කටයුතු කර ඇති බව. | නිසි අනුමැතියක් සහිතව ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ආ) | 2021 ඔක්තෝබර් 27 දිනැති අංක 16/2021 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය අනුව කටයුතු කිරීමකින් හා අනුමැතියකින් තොරව කෝන්ගහවෙල ගොවිජන සේවා කාරක සභාව මඟින් ගොවීන් 76 දෙනෙකුගේ කල්පසු වූ ණය පොලී රු.293,500 ක් කපා හැර තිබුණි. | 16/2021 දරන චක්‍රලේඛය පරිදි 2022 වර්ෂයේදී පොලී සහන ලබා දුන් ණයලාභීන් 76 දෙනෙකුගේ ණය පොලී කපා හැරීම් ලේඛනය විද්‍යුත් තැපැල මඟින් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව අනුමැතිය ලබා ගෙන කපාහැරිය යුතුය. |

### 1.3.5 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 11 ක මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.556,596 ක වත්කම් විෂයයන් 08 ක, එකතුව රු.174,463 ක වගකීම් විෂයයන් 02 ක හා දේවහුව ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකම්වලින් අඩුකිරීම් වශයෙන් දක්වා ඇති රු.1,819,801 ක ශේෂයට අදාළ උපලේඛන, ඉතුරුම් ගිණුම් පොත්, ශේෂ සනාථ කිරීම් ලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | පෙර සිට ගිණුම් වාර්තාවල එන ශේෂ වන බැවින් විස්තර සො ගැනීමට නොහැකි වී ඇති බව, ඉතිරි කිරීමේ ගිණුම්, සඳහා පාස් පොත් ලබා ගැනීමට කටයුතු කරන බව හා ඉදිරියේදී නිරාකරණය කර ගැනීමට සටහන් කර ගත් බව. | ගිණුම් ශේෂ සම්බන්ධයෙන් සියලු තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| (i) 53 (4) (අ) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 16 ක වසම් 300 ක කුඹුරු ඉඩම් නාම ලේඛන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් පරීක්ෂා කර සහතික කර නොතිබුණු අතර ගොවිජන සේවා කාරක සභා 05 ක කෘෂිකාර්මික ඉඩම් නාම ලේඛන 80 ක අඩුපාඩු සකස් කර සහතික කිරීම සඳහා යැවීමට කටයුතු කර නොතිබුණි. | ලේඛන වල අඩුපාඩු නිවැරදි කරගෙන යන අතර එම අඩුපාඩු නිවැරදි කර අත්සන් ලබා ගැනීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ii) 55 (1) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 08 ක කමිටු බල ප්‍රදේශය තුළ වූ කෘෂිකාර්මික ඉඩම් මැනීමට කටයුතු කර නොතිබුණි. | ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය (GPS) තාක්ෂණය ඔස්සේ මෘදුකාංගයක් මඟින් මැනීම් කටයුතු සිදු කරමින් පවතින බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මු.රෙ. 315 | ගොවිජන සේවා කාරක සභා 04 ක් මඟින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස අවස්ථා 63 කදී රු.12,960 ක සිට රු.5,159,700 ක් දක්වා මුදල් බැංකු ගත කිරීමට රැගෙන ගොස් තිබුණද ඒ සඳහා මාර්ගස්ථ මුදල් පිළිබඳව රක්ෂණාවරණයක් ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේදී මාර්ගස්ථ මුදල් රක්ෂණාවරණයක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| XII පරිච්ඡේදය 1.2, 1.3, 1.7 හා 13 වගන්ති | උකුවෙල ගොවිජන සේවා කාරක සභාවේ නිලධාරින් 07 දෙනෙකු 2022 වර්ෂයේදී ලබා ගත් නිවාඩු දින 37 කට අදාළව නිවාඩු අයදුම්පත් ඉදිරිපත් කර අනුමත කරවා ගෙන නොතිබුණ අතර නිලධාරින් දෙදෙනෙකුගේ නිවාඩු පිළිබඳ නිවාඩු ලේඛනයේ කිසිදු සටහනක් කර නොතිබුණි. තවද එක් සංවර්ධන නිලධාරිනියක් ලබාගත් රාජකාරි නිවාඩු 13 ක් සඳහා අනුමැතිය හා රාජකාරිය පිළිබඳ තහවුරු කිරීම් කර නොතිබුණි. | මේ වන විට අදාළ අයදුම්පත් අනුමත කර නිවාඩු ලේඛනයේ සටහන් කර ඇති බව. රාජකාරි නිවාඩු සම්බන්ධයෙන් බැහැර යාමේ ලේඛනයේ සටහන් කරවීමට කටයුතු කර ඇති බව. | ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 3.4 ඡේදය** | උකුවෙල ගොවිජන සේවා කාරක සභාව මගින් වෙළඳපල මිල සැඳහුම් ක්‍රමවේදය අනුගමනය නොකර අවස්ථා 02 කදී එකතුව රු.358,000 ක කෘෂි උපකරණ මිලදී ගෙන තිබුණි. | සැපයුම්කරුවන් ලියාපදිංචි කර නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේද ඉදිරියේදී අනුගමනය කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| **(ඉ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | ගොවිජන සේවා කාරක සභා 11 ක නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීමට සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණු අතර ගොවිජන සේවා කාරක සභා 09 ක ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළද මුද්‍රිත පිටපත් ලබා ගෙන පැමිණීම, පිටවීම අධීක්ෂණය කර නොතිබුණි. | මේ පිළිබඳව අවධානය යොමු කර කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| **(ඊ) ගොවිජන සේවා කොමසාරිස් චක්‍රලේඛ** | | | |
| (i) 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන චක්‍රලේඛයේ 01 ඡේදය | වාසලකෝට්ටේ සහ හෙට්ටිපොල ගොවිජන සේවා කාරක සභා මගින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.291,420 ක කාමර කුලී අයකර නොතිබුණි. | කුලී අයකර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 1988 මැයි 27 දිනැති අංක 322 දරන චක්‍රලේඛයේ 12 (1) ඡේදය | ගොවිජන සේවා කාරක සභා 03 කට අදාළව වසර 01 සිට වසර 24 දක්වා කාලයක සිට පැවත එන රු.123,847 ක ඉඩම් හිමි ප්‍රවේණි මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ලිපිවලින් දැනුම් දී ඇති බව, ගොවිජන සංවර්ධන අරමුදලට බැර කිරීමට කටයුතු කරන බව හා අඳ ගොවීන් හා ඉඩම් හිමියන් අතර ගැටළු මත අධිකරණයේ නඩු තීරණ මත අවශ්‍ය කටයුතු කරන බව. | චක්‍ර ලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (iii) 2018 මැයි 17 දිනැති අංක 7/5/2/1–2(1) දරන ලිපිය | ගොවිජන සේවා කාරක සභා 06 ක අවස්ථා 32 කදී රු.50,000 ක සීමාව ඉක්මවා තිබුණු එකතුව රු.8,039,634 ක ගෙවීම් සඳහා ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් අනු අත්සන් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කර එවැනි අඩුපාඩු නොවීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 23 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුව රු.15,293,441 අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප කාරක සභා 23 හි ඉකුත් වර්ෂයේ රු.10,550,864 ක අතිරික්තයක් විය. ඒ අනුව කාරක සභා 15 කට අදාළ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,891,149 ක වර්ධනයක් ද කාරක සභා 08 කට අදාළ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,148,572 ක පිරිහීමක්ද නිරීක්ෂණය විය. මෙම වර්ධනයන්ට සහනාධාර පොහොර වැඩි මිලට විකුණුම් සේවා සැපයුම් ආදායමක් ලෙස හඳුනා ගැනීම, ඉකුත් වර්ෂවල වියදම් දැරීමෙන් පසුව ප්‍රතිපූර්ණය වන මුදල් හා අඳ ප්‍රවේණි ලැබීම් ආදායම් ලෙස හඳුනා ගෙන තිබීමෙන්ම කම්වු පොහොර ආදායම්, ස්ථාවර තැන්පතු පොලී ආදායම්, ගෙවතු ආදායම්, අක්කර බදු ආදායම් හා වෙනත් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයන් හේතු වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයහි පිරිහීම්වලට වැඩි මිල පොහොර විකුණුම් ආදායම් හා මිශ්‍ර ආදායම් අඩුවීම, ආයතන හා පරිපාලන වියදම් වැඩිවීම හා අක්කර බදු ආදායම් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 14 කට අයත් ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගොවිජන සේවා කාරක සභාවට අයත් ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 05 කට අයත් වී වගාව කළ හැකි අක්කර 38 රූඩ් 03 පර්ච් 68 ක කුඹුරු ඉඩම් ප්‍රමාණයක් පුරන්ව පැවතුණි. | ඉදිරියේදී වගා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන අතර පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා වන වැඩසටහන් දිස්ත්‍රික් කාර්යාලය හරහා මේ වන විටත් සිදු කරන බව. | සියලු වගාකළ හැකි ඉඩම් වගා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විකුණා මුදල් ගෙවීමේ ණය පදනම මත ගොවිජන සේවා කාරක සහා 05 ක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් 37 දෙනෙකුට නිකුත් කළ ද්‍රව්‍යවලට අදාළව එකතුව රු.2,038,036 ක ණය ශේෂයන් අයකර ගෙන නොතිබුණි. | ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් වෙත දන්වා යවා ඇති අතර මුදල් ලබාදීම ප්‍රමාද කරන නිලධාරින්ගෙන් වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ණය ශේෂ අයකරගත යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 10 ක මූල්‍ය ප්‍රකාශනවල වසර 04 සිට වසර 17 දක්වා කාලයක සිට පැවත එන රු.5,673,259 ක ලැබිය යුතු ගිණුම් ශේෂ 29 ක් හා රු.12,200,120 ක ගෙවිය යුතු ගිණුම් ශේෂ 38 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කරන බව. | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කරගත යුතුය. |
| (ඉ) | හුණුකැටඇල කාරක සභාවට අයත් වසම් 06 ක කුඹුරු ඉඩම් අක්කර 20 පර්චස් 04 ක ප්‍රමාණයක් වගා නොකර නිෂ්කාර්ය තත්ත්වයේ පැවතුණි. | වගා කටයුතු නොකිරීම සම්බන්ධයෙන් විමර්ශනය කර හේතු විමසීම් ලිපි මේ වන විට යොමු කරමින් පවතින බව. | සියලු වගාකළ හැකි ඉඩම් වගා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | අක්කර බදු කොමිස් ගෙවිය යුත්තේ අදාළ වර්ෂයේ මාර්තු 31 දිනට පෙර අයකළ අක්කර බදු මුදල් ප්‍රමාණය මත පමණක් වුවද, දඹුල්ල හා වාසලකෝට්ටේ ගොවිජන සේවා කාරක සභා විසින් ඉකුත් වර්ෂයේ රු.111,414 ක හිඟයෙන් අයකිරීම වෙනුවෙන්ද රු.11,141 ක අක්කර බදු කොමිස් ගෙවා තිබුණි. | පෙන්වා දී ඇති අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කරන අතර 2023 වර්ෂයේදී පෙන්වා දී ඇති පරිදි අක්කර බදු කොමිස් ගෙවීමට කටයුතු කරන බව. | අදාළ වර්ෂය සඳහා මාර්තු 31 දිනට පෙර අයකළ අක්කර බදු සඳහා පමණක් කොමිස් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (උ) | පලාපත්වල ගොවිජන සේවා කාරක සභාව විසින් 2021 වර්ෂයේ සිට ගොවි සංවිධානයකින් අය විය යුතු රු.33,500 ක ශේෂයක් හා ණය පදනමට ලබාදුන් කෘෂි උපකරණ වෙනුවෙන් 2015 වර්ෂයේ සිට අය විය යුතු රු.151,619 ක ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | මුදල් ගෙවීම තව දුරටත් පැහැර හැරීම නිසා මාතලේ ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් වෙත ලිඛිතව දැනුම්දී ඇති බව. | අයවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2018 වර්ෂයේදී වැඩි මිලට ලබාගත් පොහොර අඩු මිලට විකිණීම මත බණ්ඩරපොල ගොවිජන සේවා කාරක සභාව වෙත කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.318,380 ක මුදල ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු සඳහා ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් දැනුවත් කර ඇති බව. | ලැබිය යුතු ශේෂ අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | දේවහුව ගොවිජන සේවා කාරක සභාව විසින් 2015/16 මහ කන්නය සඳහා සහනාධාර පොහොර විකිණීමෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයට ගෙවිය යුතු රු.1,798,020 ක් නිරවුල් කර නොතිබුණි. | මෙම මුදල නිරවුල් කිරීම සඳහා මාතලේ ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් වෙත දන්වා යවා ඇති බව. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතුය. |
| (ඒ) | වෙනත් ආයතනවලින් දේවහුව ගොවිජන සේවා කාරක සභාව වෙත ප්‍රතිපූරණය කර ගත යුතු රු.892,188 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තු උපදෙස් ලබා ගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කර ගත යුතුය. |
| (ඔ) | හෙට්ටිපොල ගොවිජන සේවා කාරක සභාවේ හිටපු අලෙවි සහයක නිලධාරිනියකගේ ලිඛිත ඉල්ලීමක් පදනම් කර ගනිමින් විධිමත් පරීක්ෂා කිරීමකින් හෝ අනුමැතියකින් තොරව රු.128,430 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. ඇයගේ ඉල්ලීම් ලිපිය හැර ගෙවීමට හේතුව තහවුරු වන ලියකියවිලි කිසිවක් වවුචරයට අමුණා හෝ ගොනුගත කර හෝ නොතිබුණි. | ඉල්ලීම් ලිපිය මත ගෙවීම් කළ අතර වවුචරය අනුමැතිය සඳහා ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් වෙත ඉදිරිපත් කළ බව. | විධිමත් පරීක්ෂණයකින් පසුව වන අනුමැතියක් මත ගෙවීම් සිදු කළ යුතු බව. |
| (ඕ) | හඳුන්ගමුව ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ඇතුළත් රු.171,796 ක මුදල් ඌනය සනාථ කර ගැනීම සඳහා විධිමත් පරීක්ෂණයක් සිදු කොට අදාළ ඌනතාවයන් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම මුදල මේ වන විටත් ගෙවීමට කටයුතු කර නොමැති බව අවශ්‍ය කටයුතු සඳහා නියෝජ්‍ය කොමසාරිස් වෙත වාර්තා කර ඇති බව. | ඌනතාවයන් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | දේවහුව ගොවිජන සේවා කාරක සභාව විසින් 2020 පෙබරවාරි 06 දින අලෙවිය සඳහා මිලට ගත් රු.24,750 ක විජලන යන්ත්‍ර 03 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් අලෙවි කර නොතිබුණි. | 2022 වර්ෂයේ විජලන යන්ත්‍ර 06 න් 03 ක් අලෙවි වූ අතර ඉතිරි විජලන යන්ත්‍ර 03 මෙම වර්ෂයේදී අලෙවි කිරීමට කටයුතු කරන බව. | කඩිනමින් අලෙවි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වාසලකෝට්ටේ ගොවිජන සේවා කාරක සභාවේ නිලධාරීන් දෙදෙනෙකු වෙත විකුණා මුදල් ගෙවීමේ පදනම මත නිකුත් කළ වල් කපන යන්ත්‍ර 02 ක් ණය අය කිරීමේ අකාර්යක්ෂමතාවය හේතුවෙන් නැවත පවරා ගෙන තිබුණු අතර එසේ ආපසු පවරාගත් යන්ත්‍ර තොග ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | පැවැති කොරෝනා වසංගතය නිසා විකුණා මුදල් පදනම මත ලබා දී තිබූ උපකරණ සඳහා මුදල් අය නොවූ නිසා එම උපකරණ නැවත ලබා ගැනීමට කටයුතු කළ අතර ඒවා තොග පොත්වල සටහන් කිරීමට කටයුතු කරන බව. | යන්ත්‍ර ලේඛන ගත කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 මාර්තු 15 දිනැති අංක 8205 දරන බිල්පතක් මගින් හෙට්ටිපොල කාරක සභාවේ ඉල්ලීමකින් තොරව රු.4,487,532 ක දියර පොහොර ලීටර් 5212 ක් සී/ස ලංකා පොහොර සමාගම විසින් කාරක සභාවට භාරදී තිබුණද ඒ සම්බන්ධයෙන් සුදුසු කටයුතු සිදු නොකර ගබඩාවෙහි රඳවා තිබුණු අතර 2020 වර්ෂයේ කල් ඉකුත්ව තිබුණු එම තොගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි අවසන් තොග යටතේ හා ගෙවිය යුතු ශේෂ යටතේ ද දක්වා තිබුණි. | සී/ස ලංකා පොහොර සමාගමෙන් ණය පදනමට ලද රු.4,487,532 ක් වටිනා දියර පොහොර ලීටර් 5212 ක් අවසන් තොගයට ගනු ලැබුයේ - මෙම දියර පොහොර තොගය වෙනත් මධ්‍යස්ථානයක් වෙත ගෙන යාමේදී ප්‍රවාහන ගැටළුවක් මත ඇනවුමකින් තොරව අප මධ්‍යස්ථානය වෙත ලබා දුන් අතර අප මධ්‍යස්ථානය තොග පොත් සඳහා තොගය ඇතුළත් කර ගන්නා ලද බව. | අදාළ සමාගම දැනුවත් කර පොහොර තොගය ආපසු භාරදීමට හෝ වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට යොමු කළ යුුය. |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ කාබනික පොහොර මෙට්‍රික් ටොන් 100 බැගින් නිෂ්පාදනය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් රු.200,000 බැගින් එකතුව රු.600,000 ක මුදලක් ගොවිජන සේවා කාරක සභා 03 ක් වෙත ලබා දී තිබුණ ද ඉන් රු.255,814ක් වැයකර කාබනික පොහොර ටොන් 14.78 ක් නිෂ්පාදනය කර ටොන් 4.08 ක් අලෙවි කර ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. | 2021 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ලබා දෙන ලද රු.200,000 ක මුදල කාබනික පොහොර නිෂ්පාදනය කර ලාභ ඉපයීමේ අරමුණින් කමිටුවට දෙන ලද මුදලක් නොවන අතර ඉදිරියේදී ලැබෙන උපදෙස් පරිදි කටයුතු කරන බව. | ලබාදෙන ලද සම්පූර්ණ මුදල උපයෝජනය කර ඉලක්කගත නිෂ්පාදන මට්ටම ලගා කර ගත යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගලේවෙල ගොවිජන සේවා කාරක සභාව වෙත ප්‍රදානයක් වශයෙන් ලැබී තිබුණු වටිනාකම හඳුනාගත නොහැකි රනිල බෝග පියළි කිරීමේ යන්ත්‍රයක් හා වී ඇඹරුම් යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටද නිෂ්කාර්යව පැවතුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/5/9/4 (v) හා 2022.11.28 දිනැති ලිපිවලට අනුව පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත නොමිලේ ලබා දීමට පියවර ගෙන ඇති අතර එම ආයතන මගින් මේ වන තෙක් මෙම යන්ත්‍ර 02 රැගෙන ගොස් නොමැති බව. | අදාළ ආයතනයට ලබාදීමට හෝ උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 මූල්‍ය අක්‍රමිකතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෝන්ගහවෙල ගොවිජන සේවා කාරක සභාවේ හිටපු කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරියකු කළ මූල්‍ය අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂණයකින් පසුව රු.778,310 ක් අයකිරීමට තීරණය කර, 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ රු.345,000 ක මුදලක් අයකර කිසිදු හේතු දැක්වීමකින් තොරව රු.433,310 ක මුදල අයකිරීම අත්හිටුවා තිබුණි. | නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් මත ඔහුගේ වැටුපෙන් අවකරණය කළද 2022 වර්ෂය ආරම්භයේදී ප්‍රධාන කාර්යාලය මඟින් පරීක්ෂණ ආරම්භ කිරීම මත එම වැටුප් අවකරණය කිරීම නැවැත්වීමට ප්‍රධාන කාර්යාලය මඟින් උපදෙස් ලබා දීම මත 2022 මාර්තු මස සිට වැටුප් අවකරණය කිරීම නතර කළ බව. | අක්‍රමිකතාවයකට අදාළ සියලු මුදල් අයකරගත යුතු අතර පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ඇල්කඩුව ගොවිජන සේවා කාරක සභාවේ යූරියා පොහොර නිකුත් කිරීම වෙනුවෙන් 2022 අගෝස්තු 25 දින ලැබී තිබුණු රු.40,800 ක ආදායම දෛනික ලැබීම් ලේඛනයේ සටහන් නොකර අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. පසුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට යූරියා පොහොර විකුණුම් රු.27,600 ක් පමණක් ගිණුම්ගත වී නොමැති බවට දක්වා එම වටිනාකම කම්ටු ලිපිකරුගෙන් අයවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | මේ වන විට එම මුදලින් කොටසක් ගෙවා අවසන් කර ඇති අතර ඉතිරි මුදල් 2023 ජූලි 31 දින වන විට ගෙවා අවසන් කිරීමට කටයුතු කිරීමට එකඟ වී ඇති බව. | විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමය කළ යුතුය. |
| (ඇ) | හඳුන්ගමුව ගොවිජන සේවා කාරක සභාව විසින් විකුණා මුදල් ගෙවීමේ පදනම මත සමාලෝචිත වර්ෂයේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරි වරයෙකුට නිකුත් කළ ණය මුදලින් රු.357,750 ක් පියවා තිබුණද හිටපු කම්ටු ලිපිකරු ලෙස කටයුතු කළ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරි විසින් එම මුදල් ආදායමට බැර නොකර අක්‍රමිකතාවයන් සිදු කර තිබුණි. ඉන් රු.216,750 ක් කම්ටු ලිපිකරුගේ නමින් විකුණා මුදල් ගෙවීමේ ණයක් ලෙස පොත්වල ව්‍යාජ ලෙස සටහන් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | අක්‍රමිකතාවයන් සම්බන්ධව සොයා බලා කටයුතු කළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවිජන සේවා කාරක සභා 15 කට අයත් වසම් 103 ක කෘෂිකර්ම හා පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් 103 දෙනෙකු මාස 02 සිට වසර 08 දක්වා වූ කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. | ඉදිරියේ දී මෙම නිළධාරීන් බඳවා ගතහොත් මෙම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කරන බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ගොවිජන සේවා කාරක සභා 08 ක ගොවිජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුව ගිණුම් වාර්තාව සකස් කර ඇති බව. ඉදිරියේදී වෙනම ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 14 කින් රු.1,511,200 ක් වැයකර මිලදී ගෙන භාවිතා කරන බැංකු මෘදුකාංග සඳහා රු.479,080 ක වාර්ෂික සේවා ගාස්තුද ගෙවා තිබුණද එම පද්ධති පූර්ණ ලෙස. භාවිතා නොකිරීම, සියලු දත්ත ඇතුළත් කර නොතිබීම හා ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබීම හේවෙන් වැය කළ මුදල් අනාර්ථික වී තිබුණි. | කඩිනමින් දත්ත ඇතුළත් කර අවසන් කිරීමට කටයුතු කරන බවත් ඉදිරියේදී දෙපාර්තමේන්තව මගින් හඳුන්වා දී ඇති මෘදුකාංගය යොදා ගනිමින් ගොවිජන බැංකු කටයුතු කිරීමට පියවර ගන්නා බව. | මෘදුකාංගය අරමුණු ගත කාර්යයන් සඳහා යොදවා ගත යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විනිශ්චය සභා සඳහා යොමුකර තිබූ ගොවීන් 126 කට අදාළ රු.4,000,191 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා විනිශ්චය සභා කැඳවීම් කර නොතිබුණි. | විනිශ්චය සභාවට යොමු කරන ලද ණයකරුවන් සඳහා මේ වන විට කැඳවීම් ලැබෙමින් පවතින බව | ණය කඩිනමින් අයකර ගත යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 10 ක පැවති කාන්තා ගොවි සංවිධාන 336 ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | පළමු අදියරේ ගම්මාන මට්ටමින් ගොවි සංවිධාන පිහිටවූවද දැනට කෘ.ප.නි.ස වසම් තුළ කාන්තා ගොවි සංවිධාන ක්‍රියාකාරීව පවත්වා ගෙන යාමට කටයුතු කර ඇති බව හා ගොවි සංවිධානයන් නැවත සක්‍රීය කර ගැනීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | ගොවි සංවිධාන සක්‍රීයව පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 10 ක ගොවීන් 872 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.12,771,186 ක ණය මාස 06 ත් වර්ෂ 20 ත් අතර කාලයක් කල්ගත වී ඇතත් අයකර ගෙන නොතිබුණි. | මේ වන විට එම ණය අයකර ගැනීම සඳහා විනිශ්චය සභාවට හා අධිකරණය වෙත අදාළ ගොනු යොමු කර ඇති බව. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 04 ක පැවති ළමා ඉතුරුම් ගිණුම් 680 ක ඉතුරුම් ශේෂය රු.1,000 කට වඩා අඩුවෙන් පැවතුණි. | පෙර පාසල් ගුරුවරුන් හරහා දෙමාපියන් සම්බන්ධ කර ගනිමින් දෙමාපියන් දැනුවත් කිරීම හා වසම් භාර කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් සම්බන්ධ කර ගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පෙරමඟ ළමා තැන්පත් වැඩි දියුණු කිරීමට ඉදිරියේදි කටයුතු කරන බව. | ඉතුරුම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | දඹුල්ල ගොවිජන සේවා කාරක සභාවේ සිතමු කාන්තා ගොවි සංවිධාන අනිවාර්ය තැන්පත්වලට අදාළව සාමාජිකයින් 1025 කින් යුතු ක්‍රියාකාරී ගොවි සංවිධාන 41 ක් පැවති අතර මෙම සංවිධාන වලට සාමාජිකයෙකුගෙන් මසකට රු.150 ක් බැගින් වසරකට රු.1,845,000 කට ආසන්න අනිවාර්ය තැන්පතු පවත්වාගෙන යාමේ හැකියාව පැවතිය ද ඉකුත් වර්ෂයේ රු.276,240ක් හා සමාලෝචිත වර්ෂයේ රු.330,100 ක් ලෙස අනිවාර්ය තැන්පතු ලබා ගෙන තිබුණි. | කෘෂිකාර්මික යෙදවුම් මිළ ඉහළ යෑම, පවත්නා ජීවන වියදම් ඉහළ යාම නිසා කෘෂිකර්මාන්තය සෑහෙන දුරට කඩා වැටීම හේතුවෙන් සිතමු කාන්තා ගොවි සංවිධාන අනිවාර්ය ඉතුරුම් ඉලක්ක කරා ළඟා වීමට නොහැකි විය. ඉදිරියේදී ඉතුරුම් ප්‍රවර්ධනය ඉලක්කය ළඟා කර ගැනීම සඳහා කටයුතු කරන බව. | ඉතුරුම් වැඩිකර කාන්තා ගොවි සංවිධාන ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | දඹුල්ල ගොවිජන සේවා කාරක සභාව විසින් ජනතා සමාගමකට 2001 වර්ෂයේ දී රු.1,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණද කිසිදු වාරිකයක් අයකරගෙන නොතිබුණු අතර ණය මුදලට අමතරව සමාලෝචිත වර්ෂය අවසාන දිනට අයකර ගත යුතු පොලී ලෙස රු.1,743,698 ක් ද පැවතුණි. | 2015 වර්ෂයේ විනිශ්චය සභාවට යොමු කර ඇති අතර එම නඩුව මේ වන විට පස් වතාවක් කැඳවා ඇත. පරීක්ෂණ මට්ටමේ පවතින බැවින් තීරණ ලබා දී නොමැති බව. | නඩු කටයුතු අවසන්කර නියෝග ක්‍රියාත්මක කළ යුතුය. |
| (එ) | දඹුල්ල ගොවිජන සේවා කාරක සභාව විසින් 2021 ඔක්තෝබර් 27 දිනැති අංක 16/2021 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ පියවර 05 අනුව කල්ගත වූ ණයවලට අදාළ රු.1,082,043 ක පොලී කපාහැරීම පිළිබඳව ලිඛිතව ණයගැතියන් දැනුවත් කර නොතිබුණි. | පොලී කපා හැරීමට යෝජිත ණයකරුවන්ගේ නාම ලේඛනය හා ඉන්පසු ඉතිරි වන ණය මුදල පිළිබඳව තොරතුරුත් එම ණය මුදල් තවදුරටත් ගෙවීම් පැහැර හරින්නේ නම් නීතිමය ක්‍රියා මාර්ග ගන්නා බවත් අදාළ වසම්වල කෘෂිකර්ම පර්යේෂන හා නිෂ්පාදන සහකාර නිලධාරීන් හරහා ණයකරුවන් දැනුවත් කරන බව. | අදාළ ණයකරුවන් වෙත ලිඛිතව දැන්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඡ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන චක්‍රලේඛයේ 2:5:2 ඡේදය අනුව කටයුතු නොකර අළුගොල්ල ගොවිජන සේවා කාරක සභාවේ ගොවි ජන බැංකු ණය ලබා දීමේ දී ණය පාලන කමිටුවේ ලේකම්වරයාගේ නිර්දේශ කිරීමක් නොමැතිව ණය අයදුම්පත් 15 කට අදාළ රු.1,270,000 ක ණය නිකුත් කර තිබුණි. | අතපසු වීමකින් මෙම ණය අයදුම්පත්‍ර පරික්ෂා කර ඇතත් අත්සන යොදා නිර්දේශ කිරීමට මඟහැරී ඇත. නිවැරදිව සොයා බලා නිර්දේශ කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඹ) | හිටපු කමිටු ලිපිකරුගේ අක්‍රමිකතා ලෙස රු.11,643 ක් වාසලකෝට්ටේ ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වසර 15 කට වඩා කාලයක සිට දක්වා තිබුණද මේ සම්බන්ධ සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිටපු කමිටු ලිපිකරු අක්‍රමිකතා රු.11,643 ක් වන මුදල සඳහා ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් දැනුවත් කර ඇති බව. | ලැබිය යුතු ශේෂ පියවාගැනීමට හා අක්‍රමිකතා සම්බන්ධ සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතුය. |